# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | මූල්‍ය බුද්ධි ඒකකය |
| දිනය | 2025 මාර්තු 27 |

## මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2024 වර්ෂයේ නොවැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ වාර්තාකරණ ආයතන සඳහා පරිපාලනමය දණ්ඩන පැනවීම

2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19(1) සහ 19(2) වගන්ති මගින් පැවරී ඇති බලතල අනුව එම පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට නියමිත සහ එසේ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ආයතන සඳහා දණ්ඩන පනවනු ලැබේ. අදාල අනුකූල නොවන කටයුතුවල ස්වභාවය හා බැරෑරුම්කම සැලකිල්ලට ගෙන මෙම දණ්ඩන නියම කළ හැකිය.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් වාර්තාකරණ ආයතනවල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2024 වර්ෂයේ නොවැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පහත දක්වා ඇති පරිදි එකතු කරගන්නා ලද සමස්ත දඩ මුදල රුපියල් මිලියන තුනකි (රු. 3,000,000.00). එලෙස දණ්ඩන මගින් එකතු කරගන්නා ලද මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදි.

### 1. ඉන්දියන් බැන්ක්

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | : | 2024 දෙසැම්බර් 18 |
| **වටිනාකම** | : | රු. 2,000,000.00 (රුපියල් මිලියන දෙකකි) |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | : | 2024 දෙසැම්බර් 31 |

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද රීතීන්, රෙගුලාසි සහ නියෝගයන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදි.

i. 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 6(ආ) වගන්තියට අනුව නිකුත් කරන ලද 2008 අංක 1 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ රෙගුලාසීන්හි අවශ්‍යතාවයන්ට අනුකූලව රුපියල් මිලියනයක් හෝ විදේශ මුදලින් එයට සමාන මුදල් ප්‍රමාණයක් ඉක්මවන විද්‍යුත් අරමුදල් හුවමාරුවීමේ ගනුදෙනු කිහිපයක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කිරීමට මෙම බැංකුව අපොහොසත් විය.

ii. 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ රෙගුලාසි (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1373), 2012 අංක 2 දරන එක්සත් ජාතීන්ගේ රෙගුලාසි (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1267), සහ 2017 එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී

මහජන සමූහාණ්ඩුව සම්බන්ධයෙන් වන සම්බාධක) රෙගුලාසි (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1718) යටතේ නම් කරන ලද සියලුම පුද්ගලයන්, කණ්ඩායම් සහ ආයතනවල යාවත්කාලීන ලැයිස්තු පවත්වාගෙන යාමට සහ එය බැංකුවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා වන පද්ධතියට ඇතුළත් කිරීමට මෙම බැංකුව අපොහොසත් විය.

iii. පද්ධති හා ක්‍රියාපටිපාටි වල ඉහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වුව ද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ වූ සම්බාධක සම්බන්ධව නම් කරන ලද පුද්ගලයන් හෝ ආයතන සමග බැංකුව, ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය.

**2. අමාංනා තකාෆුල් ලයිෆ් පීඑල්සී**

**දණ්ඩනය පනවන ලද දිනය** : 2024 දෙසැම්බර් 18

**වටිනාකම** : රු. 1,000,000.00 (රුපියල් මිලියනයකි)

**දණ්ඩනය ගෙවන ලද දිනය** : 2024 දෙසැම්බර් 30

**දණ්ඩනය පැනවීමට හේතුව** : පහත දැක්වෙන පරිදි 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ ඒ යටතේ නිකුත් කරන ලද රීතීන්, රෙගුලාසි සහ නියෝගයන්ට අනුකූල නොවීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදි.

i. 2024 ජුනි 03 වන දිනැති අංක 2387/02 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ රෙගුලාසි (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1373) යටතේ නම් කර ඇති පුද්ගලයන්ගේ සහ ආයතන වල සම්පූර්ණ සහ යාවත්කාලීන ලැයිස්තුවක් පවත්වාගෙන යාමට මෙම සමාගම අපොහොසත් විය.

ii. 2019 අංක 1 දරන රක්ෂණකරුවන් (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතින්හි 58 වන රීතියට අනුව 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත අනුව නිකුත් කරන ලද ඕනෑම රෙගුලාසියක් යටතේ නම් කර ඇති පුද්ගලයන් සහ ආයතනයන්හි ලැයිස්තුවක, ඕනෑම ගනුදෙනුකරුවකුගේ, අපේක්ෂිත ගනුදෙනුකරුවකුගේ හෝ ප්‍රතිලාභියකුගේ නම ඇතුළත්ව තිබේද යන්න තහවුරු කරගැනීමේ අවශ්‍යතාවයට අනුකූල වීමට සමාගම අපොහොසත් වූ අවස්ථාවන් පහත පරිදි වේ.

- 2012 අංක 2 දරන එක්සත් ජාතීන්ගේ රෙගුලාසි (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1267), සහ 2017 එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී මහජන සමූහාණ්ඩුව සම්බන්ධයෙන් වන සම්බාධක) රෙගුලාසි (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා 1718) යටතේ නම් කරන ලද පුද්ගලයන්ගේ සහ ආයතන වල ලැයිස්තුවක් පවත්වාගෙන යාමට සමාගම අපොහොසත් වීම.
- 2024 ජුනි 03 වන දිනැති අංක 2387/02 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ රෙගුලාසි (එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල

යෝජනා 1373) යටතේ නම් කර ඇති පුද්ගලයන්ගේ සහ ආයතන වල යාවත්කාලීන වූ ලැයිස්තුවෙහි සමාගමේ දැනට ව්‍යාපාරික සබඳතා පවත්වාගෙන යන කිසිදු ගනුදෙනුකරුවකු නොමැති වීම සනාථ කිරීමට සාධාරණ වාර්තාවක් හෝ සාක්ෂියක් පවත්වාගැනීමට සහ ලබාදීමට සමාගම අපොහොසත් වීම.

iii. පද්ධති හා ක්‍රියාපටිපාටි වල ඉහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය වුව ද, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා යටතේ වූ සම්බාධක සම්බන්ධව නම් කරන ලද පුද්ගලයන් හෝ ආයතන සමග සමාගම ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය.